# කලාව සහ සදාචාරය

වතාවක් උසස් පෙළ සිංහල භාෂා (පෙරහුරු) ප්‍රශ්න පත්‍රයක රචනාවකට ලැබී තිබුණු මාතෘකාව වූයේ 'ටෙලිනාට්‍ය නිෂ්පාදකයන් සමාජ සාරධර්මවලට හා සදාචාරයට අනුකූල විය යුතු ය.' යන්නයි. මම හර්මන් හෙසගේ කියුමකින් රචනය ඇරඹීමි.

'කලාකරුවාගේ සෞන්දර්යය සදාචාරය අභිබවා යයි. - හර්මන් හෙස'

කොතෙක් කල්පනා කළ නමුත් එතනින් එහාට ලියන්නට දෙයක් මට තිබුණේ නැත. කිව යුතු සියල්ල එයින් කියවෙන බැවිනි.

සදාචාරය යනු හොඳ නරක භේදය යි. හොඳ දේවල් හා නරක දේවල් මොනවා ද? අප කීපදෙනෙකුගෙන් මේ පැණය ඇසුවොත් ලැබෙන්නේ විවිධ පිළිතුරු ය. ඒ එකිනෙකාගේ සදාචාරාකල්ප එකිනෙකාට වෙනස් නිසා ය. මෙයින් කියවෙන්නේ කුමක් ද? හොඳ නරක යනු විශ්වාසයන් බව ය. ගණිත ගැටලුවකට පිළිතුරු, කිසියම් රසායන විද්‍යා, භෞතික විද්‍යා කරුණක් මෙන් අසුවල් දෙය හොඳ ය, නරක ය කියා ඔප්පු කළ හැකි ක්‍රමයක් නැත. එය එකිනෙකා සිතන හැටියට වෙනස් වෙයි. හොඳ නරක යනු විශ්වාස බව යට කීමි. විශ්වාස කිරීම යනු තර්කයෙන් තොර ව (සාධක නොමැතිව) යමක් පිළිගැනීමයි. සාධක නොමැති නිසා එය නොපිළිගත යුතු යැයි මින් අදහස් නොවේ. (විශ්වාස නොකරන මිනිසකුට ඇති බුද්ධිය කෘත්‍රිම බුද්ධියක් හා සම වනු ඇති. විශ්වාසය මිනිස් පැවැත්මේ අනිවාර්තාවකි.)

නමුත් මෙලෙස එකිනෙකාගේ සදාචාරය - එකිනෙකා හොඳ නරක ලෙස දකින දේ වෙනස් වන්නේ නම් සමාජය මහ අවුලකට ලක් වේ. එකිනෙකා හොඳ නරක ලෙස දකින දේ වෙනස් නම් තම තමන්ගේ එම විශ්වාසවලට අනුව කටයුතු කිරීමට ද නිදහස තිබිය යුතු ය. එසේ නම් ස්ත්‍රීදූෂණය හෝ මිනීමැරීම නරක නැතැ යි සිතන කෙනකුට එසේ කිරීමටත් නිදහස තිබේ ද? එසේ නොතිබිය හැකි බව ඕනෑම සදාචාරසම්පන්න මනසක් පිළිගනු ඇත. එනම් සදාචාරය එකිනෙකා අනුව වෙනස් වුවත් කාටත් පොදු සදාචාරයක් ද තිබිය යුතු බව ය. එම පොදු සදාචාරයේ නිර්ණායකය කුමක් ද? මා සිතන පරිදි එම නිර්ණායකය අනෙකාගේ නිදහසට බාධා නොකිරීම විය යුතු ය. තවත් අයකුට හිරිහැරයක් වන්නේ නම් එය සදාචාරත්මක විය නොහැක. එසේ නොතිබිය හැකි බව ඕනෑම 'සදාචාරසම්පන්න මනසක්' විසින් පිළිගනු ඇතැ යි මා ලීවේ ඒ අදහස සිතේ තබාගනිමිනි. සදාචාරය නිර්වචනය කරගැනීමට පෙර ම සදාචාරය භාවිතා කිරීමට සිදු වූයේ එලෙසිනි.

දැන් සදචාරය ගැන දන්නා නිසා කලාව ගැන සලකා බලමු. කලාකරුවාට සදාචාරය අභිබවා යා හැක්කේ කෙසේ ද? පෞද්ගලික ජීවිතයේ දී ද? සමාජ ජීවිතයේ දී ද? නැතිනම් කලා කෘතිය තුළ ද?

කලා කෘතියක් හොඳ ද නරක ද මනින්නේ එය කොතරම් ලස්සන ද නැද්ද යන්න මත ය. සමාජයේ සදාචාර විරෝධී ක්‍රියා, චරිත, දසුන් කලාකෘතියක අන්තර්ගත වීම මත එය සමාජයට හානිකර (සදාචාර විරෝධී) හෝ අවලස්සන කලාකෘතියක් බවට පත් නොවේ. ස්ත්‍රී දූෂකයකුගේ, දාම ඝාතකයකුගේ අභ්‍යයන්තර මනස නිරූපණය කිරීමේ අරමුණින් කලා කෘතියක එවැනි ජවනිකා නිරූපණය කර තිබිය හැකි ය. කැමැත්තෙන් සිදුවන ලිංගික සබඳතා සදාචාර විරෝධී ලෙස සමාජ ජීවිතයේදීවත් සලකනු නොලැබේ. එසේ නම් මිනිස් ජීවිතයේ සදාචාරය අදාල නොවන කලා කෘති තුළ ඒවා සදාචාර විරෝධී ජවනිකා ලෙස සලකා වාරණය විය යුත්තේ මන්ද? අකමැත්තෙන් සිදුවන සබඳතාවයක් වුව මිනිසුන්ගේ මානසික ස්වභාවයන්, චරිත ලක්ෂණයන් පෙන්වා දීමේ හෝ කථාපුවත ගොඩනැගීමේ අදහසින් ඇතුළත්

විය හැකි ය. සමාජයේ ඇති ජුගුප්සාජනක දේ වුව සාහිත්‍යයේ දී රසයට පෙරළෙන බව එදිරිවීර සරච්චන්ද්‍ර පවසයි. සරච්චන්ද්‍රගේ ම වචනවලින්:

> සාහිත්‍යයෙහි හා වෙනත් කලාවන්හි ඇත්තේ රස නීරස භේදය මිස සභ්‍ය අසභ්‍ය භේදය නොවේ. සභ්‍ය අසභ්‍ය භේදය ඇත්තේ සමාජයෙහි ය. සමාජයෙහි ඇති ජුගුප්සාජනක දේ වුව ද සාහිත්‍යයෙහි රසයට පෙරළේ.
>
> - කල්පනා ලෝකය

සරච්චන්ද්‍රයන් පවසන්නේ මිනිසාට සදාචාරයක් තිබුණත් කලාවට එවැන්නක් නැති බව ය. කලා කෘතියක් සදාචාර විරෝධී විය හැක්කේ එහි එන දසුන්, ජවනිකා, පුවත, චරිත අසම්මත හෝ ලිංගික වීම මත නොව කලා කෘතිය නිෂ්පාදනයේ දී අනුන්ගේ දේ සොරාගැනීම, සත්ව හිංසනය, ලිංගික/නිරුවත් දර්ශන සඳහා පෙනී සිටින නලු නිළියන්ගේ රුචි අරුචිකම්වලට ගරු නොකිරීම සහ නවක නිළියන් එවැනි රංගන සඳහා යොදාගැනීමේ දී සංවේදී භාවයකින් කටයුතු නොකිරීම, ළමා අපයෝජනය වැනි ක්‍රියා සිදු ව ඇත්තේ නම් ය. එවිට ද සදාචාර විරෝධී වන්නේ නිෂ්පාදනය මිස කලා "කෘතිය" නොවේ. සිය නිර්මාණකරනය තුළ ද කලාකරුවා සදාචාරවිරෝධී වන්නේ එවන් විටක මිස අන් විටක නොවේ. එසේ නැතිනම් නිර්මාණය විශිෂ්ටත්වයට පත්කර ගැනීමට සිදුකරන සමාජ ගවේෂණය තුළ විය හැකි ය. (නිදසුන්: ගුස්ටාව් ෆ්ලෝබෙයා එමා බෝවාරි චරිතය නිර්මාණය පිණිස ඇසුරු කළ තාවකාලික පෙම්වතියෝ)

ඇතැම් ජාතක කතා (නලිනී ජාතකය, කුණාළ ජාතකය, අසාතමන්ත ජාතකය, මුදුලක්ඛණ ජාතකය) තුළ ද එන්නේ සදාචාර විරෝධී චරිත, හැසිරීම් ඇසුරු කරන හෝ ලිංගික ජවනිකා සහිත පුවත් ය. එම කෘති සිනමාවට නැගුවහොත් මේ සදාචාරවාදීන් ඒවා ද තහනම් කිරීමට යෝජනා නරනු ඇති ද යන්න ද සිතා බැලිය යුතු ය. ජුගුප්සාව හා පිළිකුල ද රස වශයෙන් පෙරදිග දර්ශන තුළ හඳුනාගැනේ. ඒ ද සාමාන්‍ය ජීවිතයේ දී අප පිළිකුල් කරන දේ කලාවේ දී රසයක් වන බව සනාථ කරමිනි. දේශීයත්වය සමග වික්ටෝරියානු සුචරිතවාදය ගැටගසා කලාවේ නිදහස නසන්නට සිංහල සංස්කෘතිය යොදාගන්නට තැත් කරන ජාතකය වරද්දාගත් සුචරිතවාදීන්ට සයිමන් මෙසේ පිළිතුරු දෙයි.

> සුචරිතවාදය හා සභ්‍ය අසභ්‍යවාදය අනුව කලා කෘතියක් මනින්න යාම විද්‍යාත්මක සමාජවාදී දෘෂ්ටියට මෙන් ම පෙරදිග මුණිවරුන් බිහිකළ රසවාදයට ද පටහැණිය. පෙර හෙළ ආර්ය සමාජයේ දේශපාලකයකු වූ මහා පරාක්‍රමබාහු රජු ගේ කව්සිළුමිණ කාව්‍යයේ එක් සර්ගයක් කාමය බේරන බීම පාටියක් පිළිබඳ විස්තරයකි. පැරණි උගත් භික්ෂූන් වහන්සේ කෙනෙකු වන රහල් හිමියෝ සොර සැමියන් හා නිදන ගැහැණුන් ගැනත්, මිණි මෙවුල පෙනෙන්නට තරම් දුහුල් වස්ත්‍ර හැඳගත් ස්ත්‍රීන් ගැනත් මහත් අභිරුචියකින් ලිවූහ.
>
> සභ්‍යවාදය පැරණි සිංහල ආකල්පයක් නොවේ. අධිරාජ්‍යවාදය සමග ආ වික්ටෝරියානු සංස්කෘතිය විසින් අප රටෙහි ධනේශ්වර පංති රටාවකට ගලපා තහවුරු කරන ලද ප්‍රතිගාමී සුචරිතවාදයකි. එය සමාජවාදී කලා දෘෂ්ටියක් නොවේ. ප්‍රගතිශීලී සමාජ දෘෂ්ටියක්ද නොවේ.
>
> - සාහිත්‍ය, සමාජවාදය හා කලා විචාරය

මේ තර්ක තරමක් දුරට පිළිගනිමින් කෙනකු පැවසිය හැක්කේ යහපත්/කලාත්මක අරමුණකින් අසම්මත/සදාචාරවිරෝධී/ලිංගික දසුන්, සිද්ධි නිරූපණය කරන නිර්මාණයන්ට පමණක් නිදහස තිබිය යුතු බවත් කිසිදු සාධාරණ හේතුවක් නැති ව එසේ සිදුකරන නිර්මාණ කෙරෙහි පමණක් වාරණ තිබිය යුතු බවත් ය. නමුත් මේ යෝජනාවේ ඇති ගැටලුව වන්නේ එසේ හොඳ කලාකෘති මොනවාද, නරක ඒවා මොනවාද යන්න නිශ්චය කරගන්නේ කෙසේ ද යන්නයි. කලා වින්දනය ද එකිනෙකාගේ මනස අනුව

වෙනස් වන දෙයකි. කිසියම් නිර්මාණයක් අසභ්‍ය යැයි බහුතරයක් අය සැලකුවහොත් මේ යෝජනාව ක්‍රියාත්මක වන සමාජයක දී එම කෘතිය තහනම් වනු ඇත. නැතිනම් වාරණය වනු ඇත. නමුත් එම කෘතිය තුළ සැඟවුණු වටිනාකමක් ඇති බව උසස් රසවින්දනයක් සහිත උගත්, බුද්ධිමත් අතලොස්සකගේ අදහස විය හැකි ය. දැන් සිදු ව ඇත්තේ බහුතරයකගේ රසවින්දනය මත අන් අයගේ රසවින්දනය සීමා වීම නොවේ ද? පිරිසකගේ කලා රුචිකත්වය අන්‍යයන් මත ද පැටවීම නොවේ ද? තමාගේ කලා විනිශ්චය ම නිවැරදි යැයි එම බහුතර පිරිසට සනාථ කළ හැක්කේ කෙසේ ද?

සයිමන් නවගත්තේගමගේ කියුමකින් ම මේ ලිපිය අවසන් කිරීම මැනවැ යි සිතමි.

> මිනිසුන් කායික මානසික සහජ ආවේග අනුව සමාජ තහංචි කඩකරන්නේ හෝ රකින්නේ වෙනම සමාජ විද්‍යානුකූල හේතු නිසා මිස පොතකින් ඉගෙන ගෙන නොවේ.
>
> ...විකෘති කාමය හා ගණිකා වෘත්තිය සමාජයේ ඇත්නම් එය සාහිත්‍යය කෘතියක දක්නට ලැබීම තාත්විකවාදයේ ජයග්‍රහණයක් පමණි.
>
> \- සාහිත්‍ය, සමාජවාදය හා කලා විචාරය

---

\- සචින්ත මදුෂාන්